# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන)

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින්
2025 නොවැම්බර් මස 14 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 නොවැම්බර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[**38** වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, (මෙහි මින් මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් හඳුන්වනු ලබන) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රදානය කරනු ලබන බදු විරාම වර්ෂ ගණන සහ බදු නිදහස් කිරීම් හෝ බදු සහන සීමා කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු විරාම, බදු නිදහස් කිරීම් හෝ බදු සහන සඳහා හිමිකම් ලබන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීමේ කාර්ය පටිපාටිය නිශ්චිතව දැක්වීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර 4, 4අ, 4ආ, 4ඇ, 4ඈ, 4ඉ, සහ 4ඊ වගන්තිවල නීතිය බලපෑම වනුයේ පිළිවෙලින් -

(අ) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල පසු අධීක්ෂණ සම්බන්ධයෙන් අදාළ වන කාර්ය පටිපාටිය සම්බන්ධයෙන්;

(ආ) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වයක් පිළිබඳව සම්බාධක පැනවීම සඳහා විනිවිධභාවයෙන් යුතු සහ සාධාරණ කාර්ය පටිපාටියක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන්;

(ඇ) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වවල විධානාත්මක බදු වාර්තා ගොනු කිරීම, රඳවුම් ගෙවීම මත ආදායම් බදු ගෙවීමේ වගකීම, සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල සේවා නියුක්තිකයන්ගේ සේවා නියුක්ති ආදායම් බදු ගෙවීම සම්බන්ධයෙන්;

(ඈ) වාණිජ මෙහෙයුම් කටයුතුවල සහතික කළ දිනයේ දී බදු විරාම ආරම්භ කිරීම සහ එම කාල සීමාව දීර්ඝ කිරීම තහනම් කිරීම පිළිබඳ නිශ්චිතව දැක්වීම සම්බන්ධයෙන්;

(ඉ) සියලු ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ බදු වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත නියම කිරීම මගින් විනිවිධභාවය සහතික කිරීම සම්බන්ධයෙන්;

(ඊ) මේ පනත යටතේ ප්‍රදානය කරනු ලබන බදු නිදහස් කිරීම්, බදු සහන හෝ බදු විරාමවල අඛණ්ඩ අදාළත්වය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ කාලීන අධීක්ෂණයක් සිදු කිරීම සම්බන්ධයෙන්; සහ

(උ) බලය පවරා ඇති හෝ නියම කර ඇති ආකාරයට නියෝග සෑදීම සඳහා අමාත්‍යවරයා වෙත බලය ලබා දීම සම්බන්ධයෙන්,

විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියට ඇතැම් අලුත් යෙදුම්වල අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

# ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන)

එල්.ඩී.-ඕ. 38/2025

## 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2025 අංක  දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2008 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** 2011 අංක 12 දරන පනතින් අවසන්වරට සංශෝධිත, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 2 වන වගන්තියේ, අතුරු විධානයේ "වසර විසිපහක්" යන වචන වෙනුවට "වසර දහයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

*"ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම*

**3.** (1) නියම කරනු ලැබිය හැකි නිර්ණායකවලට යටත් ව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්, යම් යෝජිත ව්‍යාපෘතියක් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගනු ලැබිය යුතු ය.

(2) යෝජිත ව්‍යාපෘතිය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගැනීමෙන් පසුව, එම ව්‍යාපෘති යෝජනාව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පූර්ව පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් තාක්ෂණික සහය

PL 15525 - 475 (2025/11)

ලබාගෙන, ව්‍යාපෘතියේ පූර්ව පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සිදු කරනු ලැබිය යුතු අතර, එකී විශ්ලේෂණය පිළිබඳ නිර්දේශයක් (2) වන උපවගන්තිය යටතේ එම ව්‍යාපෘති යෝජනාව යොමු කිරීමේ දින සිට මාස එකක කාලයක් ඇතුළත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබ ඇති පරිදි සුදුසුකම් ලැබීමේ නිර්ණායක එවැනි ව්‍යාපෘතියක් විසින් සපුරා ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසුව, සහ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නිර්දේශය පිළිබඳ සැලකිල්ලට ගැනීමෙන් පසුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් වසර ගණනක බදු විරාම හෝ යම් බදු නිදහස් කිරීමක් හෝ බදු සහන ප්‍රදානයක් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ යම් ව්‍යාපෘතියක් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගැනීමෙන් පසුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එම තීරණය අමාත්‍යවරයා වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(6) අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින්-

(අ) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ නම සහ ස්වභාවය;

(ආ) 2 වන වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරන ලද මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්ති අදාළ වීමෙන් නිදහස් වන දිනය, එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බලාත්මක විය යුතු බවට; සහ

(ඇ) අමාත්‍යවරයා විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් අවශ්‍ය තොරතුරක්,

නිශ්චිතව සඳහන් කරමින් ගැසට් පත්‍රයේ නියමයක් පළ කරනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියමයක්, තොරතුරු දැනගැනීම පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:-

“ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියේ පසු අධීක්ෂණය

**4.** (1) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින්, යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කලින් කල යෝග්‍ය බවට සලකන ආකාරයට පසු අධීක්ෂණයක් සිදු කර, ඒ පිළිබඳ වාර්තාවක් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර්තාව මුදල් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙහි පළ කිරීම මඟින් මුදල් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ ප්‍රතිඵල සහ මූල්‍යමය බලපෑම් මහජනතාව වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(3) අනුමත මූලික කාර්ය සාධන දර්ශක සමඟ අනුකූලව ක්‍රියා කිරීමට යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් අපොහොසත් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් -

(අ) අනනුකූලතාවයේ ස්වභාවය; සහ

(ආ) නිවැරදි කිරීම සඳහා වන නිශ්චිත කාල සීමාවක්,

ඇතුළත් විය යුතු අනනුකූලතාවය පිළිබඳ දැන්වීමක්, අදාළ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්තිත්වය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නිශ්චිතව දක්වන ලද කාල සීමාව තුළ යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් නිවැරදි කිරීමේ ක්‍රියාව සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශය විමසා, අනනුකූලතාවයේ ස්වභාවය සහ බරපතලකම පිළිබඳ ව සැලකිල්ලට ගෙන පහත සඳහන් ක්‍රියාමාර්ගවලින් එකක් හෝ කිහිපයක් ගනු ලැබිය හැකි ය:-

(අ) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ පනත යටතේ ප්‍රදානය කරන ලද යම් හෝ සියලු බදු නිදහස් කිරීම්, බදු සහන හෝ බදු විරාම, සීමා කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම; හෝ

(ආ) මේ සම්බන්ධයෙන් සිදු වූ අලාභ අයකර ගැනීම සඳහා පරිපාලන දණ්ඩන පැනවීම.

**හේතු දක්වන ලෙස නිවේදනය කිරීම**

**4අ.** (1) 4 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාමාර්ග ගැනීමට පෙරාතුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අදාළ ක්‍රියාමාර්ග ගැනීමේ හේතු නිශ්චිතව දක්වමින් ලිඛිත දැන්වීමක් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්තිත්වය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) 4 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති

සම්බාධක පනවනු නොලැබිය යුත්තේ ඇයි ද යන්න පිළිබඳව දැන්වීම ලැබුණු දින සිට මාස එකක කාලයක් ඇතුළත ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වයට (1) වන උපවගන්තිය යටතේ වූ නිවේදනයක් මඟින් නියම කරනු ලැබිය යුතු ය.

(3) අවසන් තීරණයක් ලබා දීමට පෙරාතුව, පුද්ගලිකව හෝ බලයලත් නියෝජිතයෙකු හරහා තමා වෙනුවෙන් කරුණු දැක්වීම සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වය වෙත සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු ය.

(4) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වය විසින් හෝ එහි නියෝජිතයා විසින් ඉදිරිපත් කරන ලද නියෝජන පිළිබඳව සලකා බැලීමෙන් පසුව, ඒ සඳහා වන හේතු ලිඛිතව වාර්තා කරනු ලැබ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ පනත යටතේ ප්‍රදානය කර ඇති යම් හෝ සියලු බදු නිදහස් කිරීම්, බදු සහන හෝ බදු විරාම, සීමා කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම නැතහොත් ඒ සම්බන්ධයෙන් සිදු වූ අලාභ අයකර ගැනීම සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම කරනු ලැබිය හැකි ය.

බදු ගෙවීමේ වගකීම

**4ආ.** 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද -

(අ) සෑම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වයක් විසින් ම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව බදු වාර්තා ගොණු කරනු ලැබිය යුතු ය;

(ආ) සෑම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වයක්ම රඳවා ගැනීමේ

ගෙවීම්වලට අදාළව ආදායම් බදු ගෙවීමට යටත් වන්නේ ය; සහ

(ඇ) යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වයක වාසික හා අනේවාසික සේවා නියුක්තිකයෙකුගේ සෑම සේවා නියුක්ති ආදායමක් ම බදු ගෙවීමට යටත් වන්නේ ය.

බදු විරාම කාල සීමාව ආරම්භ කිරීම

**4ඈ.** (1) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ බදු විරාම කාල සීමාව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සහතික කරනු ලබන පරිදි එකී ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන දිනයේ සිට ආරම්භ කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට ප්‍රදානය කර ඇති බදු විරාම කාල සීමාව, කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන බදු වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාව

**4ඈ.** මුදල් අමාත්‍යාංශය විසින්, මේ පනත යටතේ සියලුම ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළව එක් එක් මූල්‍ය වර්ෂය සම්බන්ධයෙන් බදු වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් ස්වකීය නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

සමාලෝචනය

**4ඉ.** මුදල් අමාත්‍යාංශය විසින් , ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විමසා, මේ වගන්තිය ආරම්භ වන දිනයේ සිට අවුරුදු පහක් අවසන් වීමෙන් පසුව, මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බදු නිදහස් කිරීම්, බදු සහන හෝ බදු විරාමවල අඛණ්ඩ අදාළත්වය හා කාර්යක්ෂමතාව සමාලෝචනය කරනු ලැබිය හැකි ය.

නියෝග

**4ඊ.** (1) මේ පනත මඟින් නියම කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ නියෝග සෑදිය යුතු යැයි මේ පනත මඟින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එම පළකරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි එවැනි පසු දිනයක දී ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ යථා පරිදි සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.''.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

''අර්ථ නිරූපණය

**6.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය'' යන්නෙන්, 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ ආයෝජන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ; සහ

"ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති අස්ථිත්වය" යන්නෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ගිවිසුමකට ඇතුළත් වනු ලැබූ හා මේ පනතේ 3 වන වගන්තිය යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබූ ව්‍යවසායක් අදහස් වේ.".

සැක දුරු කිරීම

**6.** සැක දුරු කිරීමේ කාර්යය සඳහා, මේ සංශෝධන පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට නීත්‍යනුකූලව ප්‍රදානය කරන ලද යම් බදු විරාම, බදු නිදහස් කිරීම් සහ බදු සහන හෝ වෙනත් ප්‍රතිලාභ, ඊට සම්බන්ධ නියම සහ කොන්දේසි සමඟ අනුකූල වීමට යටත්ව, එහි නිශ්චිතව දක්වා ඇති කාල සීමාව සඳහා අඛණ්ඩව වලංගුව පැවතිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.